## 18. ව්‍යාපාර සැලැස්ම

332. ව්‍යාපාරයක පරමාර්ථ හා අරමුණු හා ඒවා ළඟා කර ගන්නා ක්‍රමෝපායයන් ඇතුළත් ව්‍යාපාරයක් සකස් කරන ලේඛනය නම්,

(1) ව්‍යාපාර සැලැස්ම ය.
(2) ව්‍යාපාර විස්තරය ය.
(3) ව්‍යාපාර වාර්ෂික සැලැස්ම ය.
(4) මූල්‍ය සැලැස්ම ය.
(5) අලෙවිකරණ සැලැස්ම ය.

(………)

333. 'ව්‍යාපාර අදහසක්' යන්නට වඩාත් නිවැරදි අදහස තෝරන්න.

(1) වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයන් හඳුනා ගැනීම සඳහා පරිසර විශ්ලේෂණයේ ප්‍රතිඵලය.
(2) සාර්ව විශ්ලේෂණය මඟින් හඳුනා ගත් ව්‍යාපාර තත්ත්වය.
(3) බාහිර පරිසර සාධක ඇගයීමක් කර තමාට අවශ්‍ය ව්‍යාපාර කටයුත්තක් සඳහා ඇති කර ගන්නා අදහස.
(4) පුද්ගලයකුගේ හෝ සංවිධානයක අවශ්‍යතාවක් හෝ වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳ සිතුවිල්ල.
(5) ව්‍යාපාර සංවිධානවල අවශ්‍යතාවක් ඉටු කිරීම සඳහා සාර්ව හා සූක්ෂම පරිසර සාධක විශ්ලේෂණයෙන් ව්‍යාපාරිකයා තුළ ඇති වන සිතුවිල්ල.

(………)

334. ව්‍යාපාර අදහස් අතරෙන් යෝග්‍යතම ව්‍යාපාර අදහස් තෝරා ගැනීම සඳහා

(1) සාර්ව විශ්ලේෂණයක් කළ යුතු ය.
(2) සූක්ෂම විශ්ලේෂණයක් කළ යුතු ය.
(3) සමස්ත වෙළෙඳ පොළ විශ්ලේෂණය කළ යුතු ය.
(4) ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කළ යුතු ය
(5) ඉලක්ක වෙළෙඳ පොළ විශ්ලේෂණය කළ යුතු ය.

(………)

335. ව්‍යාපාර සැලැස්මක මූලික අංග අතරට අයත් **නොවන** අංගය වන්නේ,

(1) ව්‍යාපාර විස්තරය යි.
(2) අලෙවි සැලැස්ම යි.
(3) වෙළෙඳ පොළ විශ්ලේෂණය යි.
(4) විධායක සාරාංශය යි.
(5) මූල්‍ය සැලැස්ම යි.

(………)

National Institute of Education

336. ව්‍යාපාර අදහස් සාර්ව විශ්ලේෂණයට භාජනය කර වඩාත් ප්‍රතිලාභ ගෙන දෙන අදහස තෝරා ගැනීම සඳහා සූක්ෂම විශ්ලේෂණයට භාජනය කළ යුතුය. සූක්ෂම විශ්ලේෂණය යටතේ ඇගයීමට භාජනය කරන්නේ,
   (1) අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය යි.
   (2) අභ්‍යන්තර පරිසරය හා ආසන්න පරිසරය යි.
   (3) ආසන්න පරිසරය හා බාහිර පරිසරය යි.
   (4) ආර්ථික පරිසරය හා ආසන්න පරිසරය යි.
   (5) ගෝලීය පරිසරය හා අභ්‍යන්තර පරිසරය යි.

(………)

337. ව්‍යාපාර අදහසක් තෝරා ගැනීමේ දී සැලකිය යුතු සූක්ෂම සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) මිල මට්ටම්, ජනගහනය, අයිතිකරුවන්, කළමනාකරුවන්
   (2) මිල මට්ටම්, තරගකරුවන්, අයිතිකරුවන්, කළමනාකරුවන්
   (3) කළමනාකරුවන්, තරගකරුවන්, ජනගහනය, මිල මට්ටම්, ආදායම් මට්ටම්
   (4) සැපයුම්කරුවන්, තරගකරුවන්, ගනුදෙනුකරුවන්, සමාජ මට්ටම්
   (5) කළමනාකරුවන්, තරගකරුවන්, අයිතිකරුවන්, සේවකයන්

(………)

338. ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු පමණක් ඇතුළත් වන්නේ,
   (1) පැහැදිලි ඉම, අවශ්‍ය මූල්‍ය සම්පත්, ගනුදෙනුකරුවන්, ඉලක්ක
   (2) පැහැදිලි ඉම, තාත්ත්වික වීම, ඉලක්කගත වීම, ගනුදෙනුකරුවන්
   (3) සම්පූර්ණත්වය, අවශ්‍ය මූල්‍ය සම්පත්, ඉලක්ක, සරල බව
   (4) අවශ්‍ය මූල්‍ය සම්පත්, ඉලක්ක, සරල බව, ගනුදෙනුකරුවන්
   (5) ගනුදෙනුකරුවන්, තරගකරුවන්, සැපයුම්කරුවන්, සේවකයන්

(………)

339. පහත වගන්ති අතරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) ව්‍යාපාර සැලැස්මක් සකසනු ලබන්නේ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා වේ.
   (2) අලෙවිකරණ සැලැස්ම මඟින් අපේක්ෂිත ලාභය ගණනය කළ හැකි ය.
   (3) කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයක දැක්වේ.
   (4) ව්‍යාපාර විස්තරයෙන් ව්‍යාපාරය සැලැස්ම පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.
   (5) ව්‍යාපාරයේ මෙහෙයුම් සැලැස්මට අනුව අලෙවිකරණ සැලැස්ම සැකසිය හැකි ය.

(………)

National Institute of Education

340. බැංකු හෝ වෙනත් මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීම සඳහා බැංකුවට ව්‍යාපාර පිළිබඳ ව වැදගත් තොරතුරු ඉදිරිපත් කරන ලියවිල්ල වනුයේ,

(1) ව්‍යාපාරයේ ලාභ අලාභ ප්‍රකාශනය
(2) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
(3) ව්‍යාපාර සැලැස්ම
(4) අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය
(5) ව්‍යාපාරිකයා පිළිබඳ ව තොරතුරු ඇතුළත් වාර්තාව

(………)

341. පහත දැක්වෙන ප්‍රකාශ අතරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යාපාරික පරමාර්ථ හා අරමුණු ද ඒවා ළඟා කර ගන්නා ක්‍රමෝපායන් විස්තර කෙරෙන ලියවිල්ල ව්‍යාපාර විස්තරය යි.
(2) ව්‍යාපාරය කුමක් ද යන්න හා ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩය හෝ සේවාව පිළිබඳ විස්තරය එමගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභත් විස්තර වන්නේ ව්‍යාපාර සැලැස්ම මඟිනි.
(3) නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා සිදුවන යෙදවුම් පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය විස්තරාත්මක ව දැක්වෙන්නේ අලෙවිකරණ සැලැස්මේ ය.
(4) ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කරන්නේ සාර්ව විශ්ලේෂණයක් කිරීමෙන් අනතුරුව ය.
(5) විධායක සාරාංශයක මූලික පරමාර්ථය බාහිර පාර්ශ්ව තවදුරටත් ව්‍යාපාරය පිළිබඳ සොයා බැලීමට පෙළඹවීම යි.

(………)

342. ව්‍යාපාර සැලැස්මක් මඟින් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන පාර්ශ්ව වන්නේ,

(1) කුඩා ව්‍යාපාරිකයන්/ විභව ආයෝජකයන්/ වාණිජ මණ්ඩලය/ කළමනාකරුවන් හා සේවකයන්/ සැපයුම්කරුවන්
(2) විභව ආයෝජකයන්/ ගනුදෙනුකරුවන්/ සැපයුම්කරුවන්/ කළමනාකරුවන් හා සේවකයන්/ බැංකු හා මූල්‍ය ආයතන
(3) විභව ආයෝජකයන්/ සම්පත් දායකයන්/ බැංකු හා මූල්‍ය ආයතන/ කළමනාකරුවන් හා සේවකයන්/ සැපයුම්කරුවන්
(4) කළමනාකරුවන් හා සේවකයන්/ සැපයුම්කරුවන්/ වාණිජ මණ්ඩලය/ වාණිජ බැංකු/ විභව ආයෝජකයන්
(5) තරගකරුවන්/ විභව ආයෝජකයන්/ පාරිභෝගිකයන්/ ප්‍රජාව / රජය

(………)

National Institute of Education

343. ව්‍යාපාරයක ද්‍රවශීලතාව හා ලාභදායිත්වය පෙන්නුම් කරනුයේ මූල්‍ය සැලැස්මේ පහත කුමන කොටස මඟින් ද ?

(1) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශනය
(2) ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ඇස්තමේන්තුගත ආදායම් ප්‍රකාශය
(3) ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ඇස්තමේන්තුගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(4) සමච්ඡේද ලක්ෂ්‍ය විග්‍රහය හා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
(5) ඇස්තමේන්තුගත ශේෂ පත්‍රය හා ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(………)

344. ව්‍යාපාර ආයතනයකට අලෙවිකරණ සැලැස්මක් වැදගත් වීමට හේතු ද, මෙහෙයුම් සැලැස්මක් වැදගත් වීමට හේතුවක් ද පහතින් දක්වා ඇත. මෙහෙයුම් සැලැස්ම වැදගත් වීමට අදාළ හේතුව වන්නේ,

(1) යෝජිත අලෙවි උපාය මාර්ග තීරණය කිරීමට ය.
(2) කර්මාන්තය හා වෙළෙඳ පොළ විශ්ලේෂණ කර ගැනීමට ය.
(3) වෙළෙඳ පොළ තරගකාරිත්වයට මුහුණ දිය හැකි බව පෙන්වා දීමට ය.
(4) තරගකරුවන්ගේ අලෙවි උපාය මාර්ග තීරණය කිරීමට ය.
(5) නිෂ්පාදිතයේ ගුණත්වය ඉහළ නංවා ගැනීමට හැකි වීම.

(………)

345. විධායක සාරාංශය ව්‍යාපාර සැලැස්මේ අතිශය වැදගත් අංගයකි. පහත සඳහන් තොරතුරුවලින් විධායක සාරාංශයට පමණක් අදාළ තොරතුරු ඇතුළත් නිවැරදි වරණය වන්නේ,

(1) ව්‍යාපාරයේ අයිතිය, ව්‍යාපාරිකයාගේ නම හා ලිපියොමුව, ව්‍යාපාරයේ දැක්ම, නිෂ්ටාව, පරමාර්ථ හා අරමුණු, තරග කිරීමට සිදු වන වෙළෙඳ පොළ
(2) ව්‍යාපාරිකයාගේ නම හා ලිපියොමුව, ව්‍යාපාරයේ ඉතිහාසය, ව්‍යාපාරයේ දැක්ම, නිෂ්ටාව, පරමාර්ථ හා අරමුණු, තරග කිරීමට සිදුවන වෙළෙඳ පොළ, මුළු ආයෝජනය
(3) ව්‍යාපාරයේ ඉතිහාසය, නිෂ්පාදන ක්‍රියාපටිපාටිය, මුළු ආයෝජනය, වෙළෙඳ පොළ අවශ්‍යතා, මූල්‍ය දර්ශක හා අනුපාත විශ්ලේෂණය
(4) ව්‍යාපාරයේ අයිතිය, ව්‍යාපාරයේ ඉතිහාසය, නිෂ්පාදන ක්‍රියාපටිපාටිය, කර්මාන්තයේ ස්වභාවය, සංවිධාන ව්‍යුහය
(5) ඉලක්ක හා විභව වෙළෙඳ පොළ, ව්‍යාපාරයේ අයිතිය, ව්‍යාපාරයේ දැක්ම, නිෂ්ටාව, පරමාර්ථ හා අරමුණු, නිෂ්පාදන ක්‍රියාපටිපාටිය, යොදා ගන්නා තාක්ෂණය

(………)



National Institute of Education

346. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමේ දී ව්‍යාපාර විස්තරය (හැඳින්වීම) යන කොටස තුළ ඇතුළත් නොවන තොරතුරු මින් කුමක් ද ?

(1) ව්‍යාපාරයේ අයිතිය
(2) ව්‍යාපාරයේ නම හා ලිපියොමුව
(3) ආරම්භ කිරීමේ සාරාංශය
(4) සංවිධාන ව්‍යුහය
(5) ව්‍යාපාරය සපයන භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර

(………)

347. ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය **නොවන** අවස්ථාවකි,

(1) නව ව්‍යාපාරයක් ආරම්භ කිරීම.
(2) පවත්නා ව්‍යාපාරය වඩාත් හොඳින් කළමනාකරණය කිරීම.
(3) පවතින ව්‍යාපාරයක් වසා දැමීමට ආසන්නව පවතින විට.
(4) පවතින ව්‍යාපාරයක් පුළුල් කිරීම.
(5) ව්‍යාපාරයක් අත්පත් කර ගැනීම හෝ වරලත් ව්‍යාපාරයක් බවට පත් කිරීම.

(………)

348. ව්‍යාපාර සැලැස්මක අනිවාර්යයෙන්ම තිබිය යුතු අංගයක් නොවන්නේ,

(1) ව්‍යාපාර ආයතනය පිළිබඳ විස්තරය යි.
(2) ශක්‍යතා අධ්‍යයනය වාර්තාව යි.
(3) මෙහෙයුම් සැලැස්ම යි.
(4) අලෙවිකරණ සැලැස්ම යි.
(5) මූල්‍ය සැලැස්ම යි.

(………)

349. ව්‍යාපාර සැලැස්මක දක්නට නැති ව්‍යාපෘතිය දක්නට ඇති කරුණකි.

(1) නිශ්චිත ආරම්භයක් හා අවසානයක් තිබීම.
(2) අවශ්‍ය ණය පහසුකම් ලබා ගැනීමට ඉදිරිපත් කිරීම.
(3) ව්‍යාපාරයේ සාර්ථක, අසාර්ථක භාවය නිශ්චය කළ හැකි වීම.
(4) ව්‍යාපාරයේ ඉදිරි කටයුතු සඳහා මගපෙන්වීම.
(5) ඉටු කර ගත හැකි අරමුණක් හෝ කිහිපයක් තිබීම.

(………)

National Institute of Education

350. පහත දැක්වෙන්නේ ප්‍රමෝද්ගේ ව්‍යාපාර සැලැස්මෙන් උපුටා ගත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය යි.

| | 2019 ජනවාරි | 2019 පෙබරවාරි |
|---|---|---|
| ආරම්භක ශේෂය | 3 | 8 |
| **මුදල් ගලා ඒම්** | 140 | 150 |
| අත්පිට විකුණුම් | 70 | 80 |
| බැංකු ණය | 50 | 30 |
| ණයගැති ලැබීම් | **(A)** | **(E)** |
| **මුදල් ගලා යාම්** | 135 | **(F)** |
| තොග | 60 | 60 |
| වැටුප් | 20 | 35 |
| පොලී | **(B)** | 06 |
| වෙනත් | 50 | 65 |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | **(C)** | **(G)** |
| මුදල් ශේෂය | **(D)** | **(H)** |

ඉහත මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ A, B, C, D, E, F, G, H යන අක්ෂරවලට අයත් නිවැරදි පිළිතුර වන්නේ,

(1) 20, 5, 6, 8, 40, 146, 16, 8

(2) 20, 5, 5, 8, 40, 150, 16, (8)

(3) 20, 5, 5, 8, 40, 146, (16), (8)

(4) 20, 5, 5, 16, 30, 146, (8), (8)

(5) 20, 5, 5, 8, 40, 146, 8, (8)

(………)

National Institute of Education

# ප්‍රශ්න සඳහා පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 5 | 46 | 3 | 91 | 2 | 136 | 2 | 181 | 4 |
| 2 | 1 | 47 | 2 | 92 | 4 | 137 | 2 | 182 | 1 |
| 3 | 3 | 48 | 3 | 93 | 1 | 138 | 3 | 183 | 4 |
| 4 | 3 | 49 | 4 | 94 | 1 | 139 | 5 | 184 | 2 |
| 5 | 2 | 50 | 3 | 95 | 5 | 140 | 5 | 185 | 2 |
| 6 | 3 | 51 | 5 | 96 | 1 | 141 | 3 | 186 | 2 |
| 7 | 3 | 52 | 5 | 97 | 3 | 142 | 3 | 187 | 3 |
| 8 | 4 | 53 | 3 | 98 | 3 | 143 | 2 | 188 | 5 |
| 9 | 3 | 54 | 1 | 99 | 4 | 144 | 2 | 189 | 1 |
| 10 | 4 | 55 | 5 | 100 | 3 | 145 | 4 | 190 | 5 |
| 11 | 2 | 56 | 2 | 101 | 1 | 146 | 3 | 191 | 4 |
| 12 | 1 | 57 | 4 | 102 | 2 | 147 | 2 | 192 | 3 |
| 13 | 3 | 58 | 3 | 103 | 1 | 148 | 2 | 193 | 3 |
| 14 | 1 | 59 | 1 | 104 | 5 | 149 | 5 | 194 | 3 |
| 15 | 3 | 60 | 1 | 105 | 2 | 150 | 4 | 195 | 2 |
| 16 | 1 | 61 | 1 | 106 | 5 | 151 | 1 | 196 | 5 |
| 17 | 3 | 62 | 2 | 107 | 4 | 152 | 4 | 197 | 1 |
| 18 | 5 | 63 | 2 | 108 | 2 | 153 | 3 | 198 | 1 |
| 19 | 2 | 64 | 4 | 109 | 2 | 154 | 4 | 199 | 1 |
| 20 | 3 | 65 | 3 | 110 | 2 | 155 | 4 | 200 | 4 |
| 21 | 4 | 66 | 2 | 111 | 2 | 156 | 2 | 201 | 1 |
| 22 | 1 | 67 | 3 | 112 | 3 | 157 | 1 | 202 | 5 |
| 23 | 5 | 68 | 5 | 113 | 4 | 158 | 2 | 203 | 5 |
| 24 | 4 | 69 | 2 | 114 | 2 | 159 | 1 | 204 | 4 |
| 25 | 4 | 70 | 1 | 115 | 1 | 160 | 5 | 205 | 5 |
| 26 | 4 | 71 | 2 | 116 | 1 | 161 | 2 | 206 | 1 |
| 27 | 5 | 72 | 5 | 117 | 4 | 162 | 2 | 207 | 5 |
| 28 | 2 | 73 | 5 | 118 | 5 | 163 | 3 | 208 | 2 |
| 29 | 4 | 74 | 4 | 119 | 4 | 164 | 2 | 209 | 2 |
| 30 | 1 | 75 | 3 | 120 | 2 | 165 | 5 | 210 | 4 |
| 31 | 2 | 76 | 1 | 121 | 3 | 166 | 4 | 211 | 5 |
| 32 | 1 | 77 | 4 | 122 | 1 | 167 | 2 | 212 | 2 |
| 33 | 3 | 78 | 3 | 123 | 5 | 168 | 3 | 213 | 3 |
| 34 | 1 | 79 | 4 | 124 | 5 | 169 | 3 | 214 | 5 |
| 35 | 1 | 80 | 3 | 125 | 2 | 170 | 5 | 215 | 2 |
| 36 | 4 | 81 | 4 | 126 | 4 | 171 | 5 | 216 | 5 |
| 37 | 4 | 82 | 2 | 127 | 2 | 172 | 5 | 217 | 3 |
| 38 | 1 | 83 | 3 | 128 | 3 | 173 | 5 | 218 | 2 |
| 39 | 1 | 84 | 3 | 129 | 4 | 174 | 1 | 219 | 4 |
| 40 | 3 | 85 | 2 | 130 | 3 | 175 | 1 | 220 | 5 |
| 41 | 2 | 86 | 4 | 131 | 2 | 176 | 5 | 221 | 2 |
| 42 | 3 | 87 | 3 | 132 | 3 | 177 | 1 | 222 | 4 |
| 43 | 2 | 88 | 2 | 133 | 4 | 178 | 3 | 223 | 3 |
| 44 | 2 | 89 | 4 | 134 | 4 | 179 | 4 | 224 | 2 |
| 45 | 1 | 90 | 5 | 135 | 5 | 180 | 5 | 225 | 4 |

National Institute of Education

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 226 | 1 | 251 | 4 | 276 | 3 | 301 | 2 | 326 | 1 |
| 227 | 5 | 252 | 4 | 277 | 2 | 302 | 5 | 327 | 1 |
| 228 | 2 | 253 | 1 | 278 | 3 | 303 | 4 | 328 | 2 |
| 229 | 5 | 254 | 5 | 279 | 5 | 304 | 3 | 329 | 4 |
| 230 | 5 | 255 | 3 | 280 | 2 | 305 | 3 | 330 | 1 |
| 231 | 2 | 256 | 5 | 281 | 4 | 306 | 2 | 331 | 3 |
| 232 | 1 | 257 | 5 | 282 | 3 | 307 | 3 | 332 | 1 |
| 233 | 2 | 258 | 4 | 283 | 4 | 308 | 5 | 333 | 4 |
| 234 | 5 | 259 | 5 | 284 | 4 | 309 | 3 | 334 | 1 |
| 235 | 2 | 260 | 3 | 285 | 2 | 310 | 3 | 335 | 3 |
| 236 | 3 | 261 | 4 | 286 | 4 | 311 | 5 | 336 | 2 |
| 237 | 4 | 262 | 3 | 287 | 3 | 312 | 3 | 337 | 5 |
| 238 | 4 | 263 | 2 | 288 | 1 | 313 | 1 | 338 | 1 |
| 239 | 3 | 264 | 1 | 289 | 2 | 314 | 1 | 339 | 3 |
| 240 | 2 | 265 | 2 | 290 | 2 | 315 | 1 | 340 | 3 |
| 241 | 4 | 266 | 2 | 291 | 4 | 316 | 1 | 341 | 5 |
| 242 | 4 | 267 | 3 | 292 | 1 | 317 | 4 | 342 | 2 |
| 243 | 3 | 268 | 3 | 293 | 1 | 318 | 5 | 343 | 1 |
| 244 | 5 | 269 | 1 | 294 | 5 | 319 | 2 | 344 | 5 |
| 245 | 2 | 270 | 3 | 295 | 4 | 320 | 3 | 345 | 2 |
| 246 | 4 | 271 | 5 | 296 | 2 | 321 | 3 | 346 | 3 |
| 247 | 5 | 272 | 3 | 297 | 3 | 322 | 2 | 347 | 3 |
| 248 | 3 | 273 | 4 | 298 | 3 | 323 | 2 | 348 | 2 |
| 249 | 3 | 274 | 5 | 299 | 2 | 324 | 3 | 349 | 1 |
| 250 | 3 | 275 | 1 | 300 | 4 | 325 | 4 | 350 | 3 |

National Institute of Education

# A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

“The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements.”